ගල්ගමුව ප්‍රාදේශීය සභාව
කුරුණෑගල දිස්ත්‍රික්කය
---------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 11 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 01 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2014 දෙසැම්බර් 10 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදි.

1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). ලෙජර් ගිණුම අනුව සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ හිටි කඩකුළී ශේෂය රු.882,766ක් වුවද, මූල්‍ය ප්‍රකාශන වල එය රු.496,993 ක් ලෙස දැක්වීමෙන් ණයගැතියන් රු.385,773 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ). 2012 වර්ෂයේ පෙර ගෙවුම් ක්‍රමයට ටෙන්ඩර් කැඳවා ලබාදී තිබූ ගල්ගමුව පොදු වෙළඳපොළ කඩ කාමර 09 කට අදාලව 2013 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.5,242,522 ක හිඟ මුදල්, ණය ගැතියන් ලෙස ගිණුම් ගතකර නොතිබුණි. එමෙන්ම බස්නැවතුම්පල ඉහල මාලයේ කඩ කාමර 8 කට හා පහත මාලයේ කඩ කාමර 17 කට අදාලව බිල්කල යුතු පෙර ගෙවුම් මුදල් ප්‍රමාණය පිළිවෙලින් රු.4,440,000 ක් හා රු.2,312,915 ක් වුවද, එය මූල්‍ය ප්‍රකාශන වලට පිළිවෙලින් රු.4,028,750 ක් හා රු.4,868,165 ක් ලෙස ගෙන තිබීම හේතුවෙන් වර්ෂයට අදාල ප්‍රාග්ධන ආදායම රු.2,144,000 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ). වර්ෂය අවසානයේ පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු රු.2,127,034 ක ප්‍රමාණය ණය හිමියන් යටතේ ගිණුම් ගතකර නොතිබූ අතර, වර්ෂයට අදාලව ගෙවිය යුතු රු.92,356 ක වාරික මුදල්, වියදම් ලෙස ගිණුම් ගතකර නොතිබුණි. එමෙන්ම සේවකයන් දෙදෙනෙකුගේ ජූනි මස වැටුප් වෙනුවෙන් ලැබී තිබූ රු.39,040 ක වැටුප් ප්‍රතිපූර්ණ වර්ෂය අවසානයට ලැබිය යුතු වැටුප් ප්‍රතිපූර්ණ වශයෙන් ගිණුම් ගතකර තිබුණි.

(ඈ). සමාලෝචිත වර්ෂය ආරම්භයට දේශීය ණය හා සංවර්ධන අරමුදල සඳහා ගෙවිය යුතු ශේෂය හා අනුරූපී ලෙජර් ගිණුමේ ශේෂය අතර පැවති රු.376,156 ක වෙනස නිවැරදි කිරීමේදී එම මුදල සමුච්චිත අරමුදල හර කරනු වෙනුවට වර්ෂයේ පොළී වියදම් ගිණුම හර කිරීම හේතුවෙන් වර්ෂයේ වියදම රු.376,156 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ). දේශීය ණය හා සංවර්ධන අරමුදල් ණය වෙනුවෙන් වර්ෂයේ පොළී වියදම රු.1,836,266 ක් වුවද, ආදායම් වියදම් ගිණුමට එය රු.1,166,181 ක් ලෙස ගෙන තිබීම මත වර්ෂයේ පොළී වියදම රු.670,085 ක් අඩුවෙන් දක්වා තිබුණි. වර්ෂයේ අවසන් කාර්තුව වෙනුවෙන් ගෙවිය යුතු රු.445,692 ක පොළී මුදල ගෙවිය යුතු පොළී ලෙස ගිණුම් ගතකර නොතිබුණි. එමෙන්ම දේශීය ණය සංවර්ධන අරමුදල් ශේෂ සහතික අනුව 2013 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ණය ශේෂය රු.20,210,723 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන වල එය රු.19,960,363 ක් ලෙස දැක්වීම මත ණය හිමියන් රු.250,360 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ). 2012 වර්ෂයේ ගිණුම් ගත නොවූ රු.1,400,620 ක JCB යන්ත්‍ර කුලී ණයගැති වටිනාකම සමාලෝචිත වර්ෂයේ කුලී මුදල් ගිණුම බැර කිරීම හේතුවෙන් වර්ෂයේ කුලී ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂයට අදාල JCB යන්ත්‍ර කුලී ණයගැති ප්‍රමාණය වූ රු.2,440,862 ක් සමුච්චිත අරමුදලට බැර කිරීම හේතුවෙන් වර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(උ). සමාලෝචිත වර්ෂයේ තලන රෝල ණයගැති ලැබීම් රු.226,038 ක් වුවද, ණයගැතියන් වැඩිපුර වෙන්කිරීම් නිවැරදි කිරීම සඳහා වූ ජ'නල් සටහන් අංක 39 මගින් රු.1,829,126 ක මුදලක් ණයගැති ගිණුමට බැරකර යන්ත්‍ර කුලී ගිණුම හර කිරීම හේතුවෙන් වර්ෂයේ ආදායම රු.1,603,088 ක් අඩුවෙන් දක්වා තිබුණි. එමෙන්ම ජ'නල් සටහන් අංක 38 මගින් සමාලෝචිත වර්ෂයට අදාල තලනරෝල ණයගැතියන් ගිණුම් ගත කිරීමේදී රු.202,465 ක පැරණි ශේෂයක්ද සහිතව රු.834,794 ක මුදලක් ණය ගැතියන් හරකර යන්ත්‍ර කුලී ගිණුම බැර කිරීම හේතුවෙන් වර්ෂයේ ආදායම රු.202,465 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඌ). ඉකුත් වර්ෂය අවසානයට ණයහිමියන් යටතේ ප්‍රතිපාදනය කරන ලදුව සමාලෝචිත වර්ෂය තුලද නිරවුල් නොවූ රු.2,636,302 ක් වර්ෂ අවසානයේදී ණය හිමියන් යටතේ දක්වා නොතිබුණි.

(එ) අවස්ථා 02 ක් යටතේ මුදල් ගලායාම් ලෙස දැක්විය යුතු රු.12,817,239 ක මුදලක් මුදල් ගලා ඒම් ලෙසද, අවස්ථා 01 යටතේ මුදල් ගලා ඒම් ලෙස දැක්විය යුතු රු.3,472,852 ක මුදලක් මුදල් ගලායාම් ලෙසද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා තිබුණි. එමෙන්ම අවස්ථා 02 ක් යටතේ මුදල් ගලායාම් ලෙස දැක්විය යුතු රු.8,878,337 ක මුදලක් සහ අවස්ථා 02 ක් යටතේ මුදල් ගලා ඒම් ලෙස දැක්විය යුතු රු.11,058,378 ක මුදලක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා නොතිබුණි.

(ඒ). සමාලෝචිත වර්ෂය අවසානයට අවස්ථා 6 ක් යටතේ පියවීමට තිබුණු රු.42,000 ක අත්තිකාරම්, වර්ෂය අවසානයට නොපියවූ අත්තිකාරම් ලෙස ගිණුම් ගතකර නොතිබුණි.

1.3.2 <u>අසම්භාව්‍ය බැරකම්</u>

ප්‍රාදේශීය සභාවේ සේවය කර විශ්‍රාම ලබා ඇති පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු සේවකයන්ට අදාලව සභාව විසින් එම අරමුදලට ගෙවිය යුතු දායක මුදල් නිසි පරිදි නොගෙවීම නිසා සමාලෝචිත වර්ෂය අවසානය වන විට එම අරමුදලට ගෙවිය යුතු ශේෂය රු.2,127,034 ක්ව තිබුණි .

1.3.3 <u>නොසැසඳූ පාලන ගිණුම්</u>

සමාලෝචිත වර්ෂයට අදාලව බිල් කිරීම් හා අවසාන ශේෂය යටතේ ගිණුම් විෂයයන්1 0 කට අදාලව ගිණුම අනුව සහ අදාල ලේඛන අනුව අනුරූපී අගයන් අතර රු .1,666,746 ක නොසැසඳීම් පැවතුණි.

1.3.4 <u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම රු.69,196,225 ක් වූ අතර එයින් රු.12,360,472 කට අදාලව කාල විශ්ලේෂණ ඉදිරිපත් නොවුණි.

(ආ) 2013 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතුව තිබූ ගිණුම් ශේෂ වල වටිනාකම රු.96,201,336 ක් වූ අතර, එයින් රු.69,624,604 කට අදාලව කාල විශ්ලේෂණ ඉදිරිපත් නොවුණි.

1.3.5 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීම නිසා එකතුව රු .11,005,975 ක ගනුදෙනු පිළිබඳව විස්තරාත්මක පරීක්ෂාවක් කළ නොහැකි විය.

02. <u>මූල්‍ය සමාලෝචනය</u>

2.1 <u>මූල්‍ය ප්‍රතිඵලය</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.7,715,293 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.31,503,440 ක් වීමෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.23,788,147 ක පිරිහීමක් පැවතුණි. මෙකී මූල්‍ය ප්‍රතිඵලයට රු.42,728,377 ක් වූ ප්‍රාග්ධන ආදායම් හා රු.41,956,864 ක් වූ ප්‍රාග්ධන වැය ගැලපූ විට සමාලෝචිත වර්ෂයට අදාල අතිරික්තය රු.8,486,806 දක්වා වැඩිවී තිබුණි.

2.2 <u>විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). සමාලෝචිත වර්ෂයට අදාලව සභාවේ මුළු පුනරාවර්තන ආදායම වූ රු.57,898,238 න් සියයට 50 ක් ලෙස රු.29,044,309 ක් උත්පාදිත ආදායම් නොවන උසාවි දඩ, මුද්දර ගාස්තු, වැටුප් ප්‍රතිපූර්ණ වැනි දීමනා ස්වරූපයේ ලැබීම් වලින් සමන්විත විය. එමෙන්ම ප්‍රාග්ධන ආදායම වූ රු.42,728,377 ක ප්‍රමාණය මගනැගුම, දැයට කිරුළ, වයඹ පුබුදුව වැනි ප්‍රභවයන් මත වෙනත් ආයතන මගින් බල ප්‍රදේශයේ සංවර්ධන කාර්යයන් සඳහා ලද මුදල් වලින් සමන්විත විය.

(ආ). සමාලෝචිත වර්ෂයට අදාල මුළු පුනරාවර්තන වියදම වූ රු.50,182,945 න් සියයට 50 ක් ලෙස රු.25,301,194 ක් පෞද්ගලික පඩිනඩි වියදම වූ අතර, ඉන් සියයට 90 ක් ලෙස රු.22,889,979 ක් වැටුප් ප්‍රතිපූර්ණ ලෙස පළාත් පාලන කොමසාරිස් වෙතින් ලැබී ආදායම් ආධාර යටතේ ගිණුම් ගතකර තිබුණි. එමෙන්ම ප්‍රාග්ධන වියදම වූ රු.41,956,864 න් සියයට 7ක් ලෙස රු.3,100,000 ක් පමණක් සභා අරමුදලින් වැයවී තිබුණු අතර, ඉතිරි සියයට 93ක් වූ රු.38,856,864 ක ප්‍රමාණය මගනැගුම, වයඹ පුබුදුව, දැයට කිරුළ වැනි වැනි ප්‍රභව මත වෙනත් ආයතන ප්‍රතිපාදන වලින් ඉටුකල සංවර්ධන කාර්යයන්ගෙන් සමන්විත විය.

2.3 <u>කාරක ප්‍රාග්ධන කළමනාකරණය</u>

අංක 0003859214 දරන පොදු ගිණුමට අදාල 2013 දෙසැම්බර් මාසයේ බැංකු සැසඳුම අනුව වසරකට වැඩි කාලයක සිට පවතින රු.149,970 ක ශේෂයක් බැංකු සැසඳුම පිළියෙල කිරීමේදී මුදල් පොතේ ශේෂයෙන් අඩුකර දක්වා තිබූ අතර, 2013 දෙසැම්බර් මස බැංකු සැසඳුමෙහිද එය නිරවුල් කර නොතිබුණි. එමෙන්ම 2013 දෙසැම්බර් මස බැංකු සැසඳුම අනුව පැවති මාස 06 ඉක්මවූ රු.32,788 ක වටිනාකමැති නිකුත් කල නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොවූ චෙක්පත් 12 සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 396 (ඈ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

2.4 <u>ආදායම් පරිපාලනය</u>

2.4.1 <u>ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය</u>

වෙළඳ බලපත්‍ර, ව්‍යාපාර බදු, කඩකුලී, බදුකුලී වැනි ආදායම් ක්ෂේත්‍රයේදී එකතු කිරිම සඳහා නිශ්චිත බලයක් නොතිබුණ ද සභාවේ ආදායම් එකතු කරන්නන් විසින් වර්ෂය පුරාම වරිපනම් බදු හා වෙළඳ බලපත්‍ර වැනි ආදායම් ද ක්ෂේත්‍රෙයදි එකතු කර තිබුණි.

2.4.2 <u>වරිපනම් බදු</u>

වරිපනම් හිඟ එකතු කිරීමේදී ආණමඩුව පාර ඒකක 20 කට අදාලව රු.10,651 කට පමණක් 2013 ඔක්තෝබර් මස අවසන් නිවේදන නිකුත් කර තිබූ අතර, අනෙකුත් හිඟ බදු අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය තුල අවශ්‍ය ක්‍රියා මාර්ගයන් ගෙන නොතිබුණි. එමෙන්ම වරිපනම් ඒකක 362 කට අදාලව සිදුකල නියැදි පරික්ෂාවට අනුව නිකවැව පාර වම / දකුණ හා ආණමඩුව පාරෙහි වසරකට වැඩි කාලයක සිට අයනොවී පවතින වරිපනම් ඒකක 35 කට අදාල රු.88,124 ක හිඟයක් හඳුනාගත හැකි විය.

2.4.3 <u>බදු කුලී</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). දේපළ බදුදීම් යටතේ 1994 වර්ෂයට අදාලව රු.48,715 ක්ද, 2009 වර්ෂයට අදාලව රු.16,755 ක්ද, 2011 වර්ෂයට අදාලව රු.414,866 ක්ද හා 2012 වර්ෂයට අදාලව රු.214,492 ක්ද ලෙස එකතුව රු.694,828 ක්වූ හිඟ බදුකුලී ශේෂයක් පැවතුණි.

(ආ). පෙර ගෙවීම් ක්‍රමයට පැරණි බදුකරුවන් වෙත ලබාදී තිබූ ගල්ගමුව පොදු වෙළඳපල කඩකාමර 22 න් කඩ කාමර 21 කට අදාලව මාසික වාරික 03 ත් 22 ත් අතර පරාසයක එකතු වටිනාකම රු.472,800 ක්වූ කඩකුලී හිඟයක්ද, ගල්ගමුව බස්නැවතුම්පල පහත මාලයේ කඩ කාමර 13 කට අදාලව රු.94,000 ක කඩකුලී හිඟයක්ද පැවතුණි.

2.4.4 <u>ව්‍යාපාර බදු හා වෙළඳ බලපත්‍ර ගාස්තු</u>

1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ රීති 59 සිට 67 දක්වා ඇති රීති ප්‍රකාරව සභා බල ප්‍රදේශය තුල සමීක්ෂණයක් පැවැත්විය යුතු අතර, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150(1) හා 152(1) වගන්ති ප්‍රකාරව, කර්මාන්ත හා වෙළඳ ව්‍යාපාර පිළිබඳව ලැයිස්තුවක් පිළියෙල කර ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතු විය. එසේම සභාව විසින් පනවන ලද බද්ද දින 7 ක් ඇතුලත ගෙවන ලෙස ප්‍රා.ස. 26 ආකෘතිය මඟින් අදාල පාර්ශවයන්ට දැනුම් දිය යුතු වුවද, සභාව විසින් එසේ කර නොතිබුණි.

2.4.5 <u>යන්ත්‍ර කුලී</u>

සභාව සතු මෝටර් ග්‍රේඩරය කුලියට දීම වෙනුවෙන් 2009 සිට 2013 දක්වා කාලයට අදාලව රු.3,413,734 ක හිඟ මුදලක් පැවති අතර, සභාව සතු තලන රෝල කුලියට දීම වෙනුවෙන් 2012 වර්ෂයට අදාලව රු.867,225 ක්ද, සමාලෝචිත වර්ෂයට අදාලව රු.632,329 ක්ද වශයෙන් එකතුව රු.1,499,554 ක් අයකර ගැනීමට තිබුණි.

2.4.6. <u>පෙර ගෙවුම් මුදල්</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

(අ). 2012 වර්ෂයේදී අවම තක්සේරුව මත පැරණි කඩ හිමියන් වෙත පෙර ගෙවුම් මුදල් ක්‍රමය යටතේ තක්සේරු මුදලින් සියයට 50 ක් මුලින් ගෙවා ඉතිරිය සමාන මාසික වාරික 24 කින් ගෙවීමේ පදනම මත එකතු වටිනාකම රු.16,500,262 කට ලබාදී තිබූ ගල්ගමුව පොදු වෙළඳපල කඩ කාමර 22 ට අදාලව, කුලී මුදල් අයකර ගැනීම් සටහන් කිරීම සඳහා විධිමත් ලේඛනයක් පවත්වා නොතිබුණි. ඒ හේතුවෙන් තවදුරටත් අයවිය යුතු හිඟයන් නිශ්චිතව හඳුනාගත නොහැකි විය. එහෙත් විගණනයට ලද තොරතුරු හා පරික්ෂා කිරීම් අනුව එකවර ලැබිය යුතු සියයට 50 ක මුදල යටතේ කඩ කාමර 4 කට අදාලව රු.1,068,224 ක් අයවීමට ඇති බවත්, වාරික ලෙස ලැබිය යුතු මුදලින් කඩ කාමර 18 කට අදාලව වාරික 01 සිට 22 අතර පරාසයක එකතු වටිනාකම රු.4,653,657 ක හිඟයක්ද පැවති බවක් නිරීක්ෂණය විය.

(ආ). 2012 අප්‍රේල් මස ටෙන්ඩර් වටිනාකම රු.9,614,664 ක් වූ පෙර ගෙවුම් මුදලකට ලබාදී තිබූ ගල්ගමුව පොදු වෙළඳපල කඩ කාමර 12 ට අදාල මුදල් අයකර ගැනීම් සටහන් කිරීම සඳහා විධිමත් ලේඛනයක් පවත්වා නොතිබීම හේතුවෙන් තවදුරටත් අයවිය යුතු හිඟයන් නිශ්චිතව හඳුනාගත නොහැකි විය. එහෙත් විගණනයට ලද තොරතුරු හා පරික්ෂා කිරීම් අනුව මේ යටතේ කඩ කාමර 9 කට අදාලව රු.5,242,522 ක හිඟයක් හඳුනාගත හැකි වූ අතර, මෙයින් කඩ කාමර 5 කට අදාලව රු.4,630,918 ක්වූ මුළු මුදලමද හිඟව පැවතුණි.

(ඇ). තක්සේරු මුදලින් සියයට 50 ක් මුලින් ගෙවා ඉතිරිය සමාන මාසික වාරික 24 කින් ගෙවීමට පෙර ගෙවුම් මුදල් ක්‍රමයට ලබාදී තිබූ අවම තක්සේරු එකතුව රු.8,300,000 ක් වූ ගල්ගමුව බස්නැවතුම්පල පහත මාලයේ කඩ කාමර 17 ට අදාලව පොදු ලිපිගොනුව ක්‍රමානුකූලව නඩත්තු කර නොතිබුණි. කඩ ලබාදුන් පදනම, මුදල් ගෙවිය යුතු දිනයන් හා ඊට අදාල අනෙකුත් ප්‍රමාණවත් තොරතුරු විගණනයේදී හඳුනා ගැනීමට නොහැකි විය. සභාවේ පැවති කුලී අයවීම් විස්තර හා විගණනයේදී කල පරික්ෂා කිරීම් මත කඩ කාමර 4 කට අදාලව එකවර ලැබිය යුතු සියයට 50 ක මුදලින් රු.500,000 ක් හා කඩ කාමර 16 කට අදාලව වාරික වශයෙන් අයවිය යුතු මුදලින් රු.3,434,345 ක හිඟයක් ද පැවතිණි.

03. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

3.1 <u>කාර්ය සාධන ඇගයීම</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

(අ). සභා බල ප්‍රදේශයෙහි දුරකථන සම්ප්‍රේෂණ කුළුණු 03 ක් පිහිටා ඇති අතර, සමාලෝචිත වර්ෂය තුල එක් කුළුණක් සඳහා රු.227,360 ක ගාස්තුවක් අයකර තිබුණි. එමෙන්ම සභා බල ප්‍රදේශය තුල වීථි පහන් 1704 ක් සවිකර ඒ සඳහා උපකරණ වැය වශයෙන් රු.900,000 ක් හා නඩත්තු කම්කරු කුලී සඳහා රු.32,400 ක් වශයෙන් රු.932,400 ක වියදමක්ද දරා තිබුණි.

(ආ). සභාව විසින් සමාලෝචිත වර්ෂය තුල ඉටුකිරීමට සැලසුම්කර තිබූ රු.195,000 ක් වටිනා සුභ සාධක කාර්යයන් 03 ක් ද, රු.23,600,000 ක් වටිනා ප්‍රාග්ධන කාර්යයන් 6 ක්ද ඉටුකර නොතිබුණි.

3.2 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

පහත සඳහන් කරනු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). ගල්ගමුව පොදු වෙළඳපල කඩ කාමර 12 න් 2012 වර්ෂයේදී පෙර ගෙවුම් ක්‍රමයට ලබාදී තිබූ කඩ කාමර 9 කට අදාලව සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම ගිවිසුම් ගතව නොතිබුණි. මෙකී කඩ කාමර සඳහා කුලී මුදල් බිල් කිරීමක් සිදුව නොමැති අතර, 2014 පෙබරවාරි 25 දින විගණනයේදී සිදුකල ස්ථානීය පරික්ෂාවට අනුව කඩ කාමර 4ක් ව්‍යාපාරික කටයුතු සඳහා විවෘතව පවතින බව හඳුනාගත හැකි විය. එමෙන්ම අවම ලංසු එකතුව රු.13,544,235 ක් වූ කඩ කාමර 3 ක්ද සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම කුලියට දීම හෝ වෙනත් නිශ්චිත කාර්යයකට යොදවා නොතිබුණි.

(ආ). ගල්ගමුව බස් නැවතුම්පල ඉහල මාලයේ අවම ලංසු එකතුව රු.6,052,000 ක් වූ කඩ කාමර 11 ක් 2013 වර්ෂයේදී අවස්ථා 02 කදී ටෙන්ඩර් කැඳවා පෙර ගෙවුම් ක්‍රමය මත ලබාදී තිබූ අතර, අවම ලංසු එකතුව රු.1,641,000 ක් වූ කඩ කාමර 3 ක් ටෙන්ඩර් මගින් ලබාදී ඇත්ද යන්න නිශ්චිතව හඳුනාගත නොහැකි විය. රු.556,000 කට ලබාදී තිබූ අංක 1 කඩ කාමරයට අදාලව රු.356,000 ක මුදලක් 2013 දෙසැම්බර් 31 වන විටද හිඟව පැවතුණි. කඩ කාමර 3 සඳහා පමණක් ගිවිසුම් අත්සන් කර පැවති අතර කඩ කාමර 5 ක් සඳහා විගණිත දිනය වන විටද ගිවිසුම් අත්සන් කර නොතිබුණි. එමෙන්ම කුලී තක්සේරු වාර්තා අනුව කඩ කාමරයක් වෙනුවෙන් මාසිකව රු.1,100 ක කුලියක් බිල්කල හැකි වුවද, 2013 වර්ෂය සඳහා කඩකුලී බිල්කර හෝ අයකර ඇති බවක් නිරීක්ෂණය නොවීය.

(ඇ). ගල්ගමුව පොදු වෙළඳපල ඉදිරිපිට පැවති කඩ, පොදු වෙළඳපල ඉදිකිරීමත් සමඟ ඉවත්කර තිබුණු අතර එයින් කඩ කාමර 10 ක් සඳහා 2012 දෙසැම්බර් 31 වන විට රු.18,933 ක හිඟ කඩ කුලියක් අයවීමට පැවතිණි. වගකිව යුතු නිලධාරින්ගේ අනුමැතියකින් තොරව එම කඩ කාමර හිඟ 2013 වර්ෂයේ කඩකුලී ලේඛනයෙන්ද ඉවත්කර තිබුණි. එමෙන්ම බස්නැවතුම්පල (පැරණි) කඩ කාමර 10 ක් 2013 වර්ෂයේ කඩකුලී ලේඛනයෙන් ඉවත් කර තිබුණද එලෙස ඉවත් කිරීමට නිශ්චිත හේතු හඳුනා ගැනීමට

නොහැකි වූ අතරම එම කඩ කාමර වලට අදාලව 2013 ජනවාරි 01 දිනට පැවති රු.34,480 ක හිඟ ශේෂයද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ). සභාව විසින් 2009-2012 කාලය තුල අනුමත කල ගොඩනැගිලි අයදුම්පත් 233 න් සමාලෝචිත වර්ෂය වන විටත් අනුකූලතා සහතික ලබා නොගත් ස්ථාන 213 ක් විය. එමෙන්ම ප්‍රමාද ගාස්තු හා අනුකූලතා සහතික ලබාදීමේදී අයකල හැකි ගාස්තු පිළිබඳව විධිවිධාන සභාව විසින් පනවා ගෙන නොතිබුණි.

(ඉ). 2012 වර්ෂයේ ගල්ගමුව එළහරක් මස් කඩය බදුදීම වෙනුවෙන් අයකළ යුතු රු.196,498 ක හිඟ ශේෂය අයකිරීම සඳහා 2013 දෙසැම්බර් 27 විගණන දිනය වන විටද එන්තර වාසි යැවීම පමණක් සිදුව තිබුණි.

3.3 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

ගල්ගමුව වැවෙහි ව්‍යායාම කටයුතු සඳහා ව්‍යායාම බෝට්ටු යෙදවීම වෙනුවෙන් 2013 වර්ෂයේ මෙහෙයුම් ආධාර යටතේ රු.500,000 ක් හා ඉතිරිය සභා අරමුදල් මගින් වැයකර රු.637,975 ක වටිනාකමකට ව්‍යායාම බෝට්ටු 4 ක් සභාව විසින් මිළදීගෙන තිබුණි. වැවෙහි ඇති පාසි හා අනෙකුත් ගස් වර්ග හේතුවෙන් එම බෝට්ටු අදාල කාර්යයට යෙදවීමට නොහැකිව මාස 05 කට අධික කාලයක සිට බෝට්ටු ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථාන භූමියෙහි තබා තිබුණි. එම බෝට්ටු වල වහලය දිරාපත්වී විනාශ වෙමින් පවතින බව 2014 පෙබරවාරි 25 සිදුකළ භෞතික විගණන පරික්ෂාවේදී අනාවරණය විය.

4. <u>ගිණුම් කටයුතු භාවය හා යහපාලනය</u>

4.1 <u>අයවැය පාලනය</u>

සමාලෝචිත වර්ෂයට අදාලව අයවැය ලේඛනය අනුව රු.69,774,000 ක පුනරාවර්ථන ආදායමක් හා රු.135,587,000 ක ප්‍රාග්ධන ආදායමක් ඇස්තමේන්තු කර පැවතියද, එයින් ලඟාවී තිබුණේ පුනරාවර්තන ආදායම් යටතේ සියයට 80 ක් ලෙස රු.56,414,000 ක් හා ප්‍රාග්ධන ආදායම් යටතේ සියයට 9 ක් ලෙස රු.11,900,000 ක් පමණි. එමෙන්ම සභාවේ උත්පාදිත ආදායම් යටතේ ඇස්තමේන්තුගත ආදායම රු.20,965,000 ක් වූ අතර අයකරගෙන ඇති ආදායම රු.11,138,000 ක් විය.

05. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු  කරනු ලැබේ.

(අ). ගිණුම්කරණය

(ආ). අයවැය පාලනය

(ඇ). මූල්‍ය  පාලනය

(ඈ). ආදායම් පරිපාලනය

(ඉ). වත්කම්  කළමනාකරණය